# අභ්‍යන්තර ප්‍රතිපත්ති මාලාව

## අලව්ව ප්‍රාදේශීය සභාව



අභ්‍යන්තර ප්‍රතිපත්ති

# පටුන

අලව්ව ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ ජනතාවගේ ජන ජීවිතය සුඛිත මුදිත කරලීම සඳහා 1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පණතේ132 වගන්ති විධි විධාන වලට අනුකූලව හා සම්මත අතුරු ව්‍යවස්ථා වලට අනුව සේවා සැපයිම සඳහා 2023.08.22 වන දින පැවති කළමනාකරණ කමිටුවේ නිර්දේශ අංක 05 යටතේ නිර්දේශ කර ගත් ප්‍රතිපත්ති පහත සඳහන් පරිදි සකස් කර ඇත.

01. අලව්ව ප්‍රාදේශීය සභාවේ කටයුතු සඳහා කාන්තා නියෝජනය ලබා දීම සඳහා වන ප්‍රතිපත්ති

02. අඩු ආදායම්ලාභීන් සඳහා සහනාධාර ලබා දීම වෙනුවෙන් වූ අභ්‍යන්තර ප්‍රතිපත්ති

03. වරප්‍රසාද නොලත් කණ්ඩායම් සවිබල ගැන්ම සහ වන අභ්‍යන්තර ප්‍රතිපත්ති

04. ආබාධිත පුරවැසියන් ආවරණය කිරිම සඳහා වන ප්‍රතිපත්ති

05. අවිධිමත් පදිංචිකරුන් සහ අවතැන්වූවන් ආවරණය කිරීමේ ප්‍රතිපත්තිය

06. ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට ව්‍යපීරේඛ විධිවිධාන පිරිනැම්ම සඳහා වන ප්‍රතිපත්ති

07. අලව්ව ප්‍රාදේශීය සභාවේ පරිසර ප්‍රතිපත්ති

08. අලව්ව ප්‍රාදේශීය සභාවේ ජල සහ සනීපාරක්ෂක ප්‍රතිපත්ති.

09. අලව්ව ප්‍රාදේශීය සභාවේසනීපාරක්ෂක සේවකයින්ට සහ ඔවුන්ගේ පවුල් වලට උපකාර කිරීමේ අභ්‍යන්තර ප්‍රතිපත්ති

10. අවිධිමත් ව්‍යාපාර ආවරණය කිරීමේ ප්‍රතිපත්තිය.

11. පොදු වෙළඳපොල සංකීර්ණය පවත්වාගෙන යාම සම්බන්ධයෙන් ප්‍රතිපත්තිය

12. සති පොල පවත්වාගෙන යාම සම්බන්ධයෙන් ප්‍රතිපත්තිය.

13. අවදානම් සහිත කණ්ඩායම් සඳහා පිලියෙල කරන ලද අභ්‍යන්තර ප්‍රතිපත්තිය

14. ආර්ථික වශයෙන් වරප්‍රසාද නොලත් කණ්ඩායම් සඳහා සුසානභූමි / මිහිදන්භූමි වෙන් කිරීම හා ගාස්තු අය කිරීමට අදාල අභ්‍යන්තර ප්‍රතිපත්ති

15. අලව්ව ප්‍රාදේශීය සභාවේ ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ප්‍රතිපත්තිය

අලව්ව ප්‍රාදේශිය බල ප්‍රදේශයේ ජනතාව මෙන්ම සභා බල ප්‍රාදේශයේ සේවා සපයාගන්නා සෙසු ජනතාවටද මහෝපකාරී වන ආකාරයට ප්‍රාදේශිය සභා පනත් හා අතුරු ව්‍යවස්ථා වලට අනුකූලව සකස්කරන ලද ඉහත ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරමින් සේවා ඉටුකිරිම සඳහා ඔබගේ මනා සහයෝගය අපේක්ෂා කරමු.

ඉහත ප්‍රතිපත්ති වල යම් වෙනසක් සිදු විය යුතු නම් ඒ බව අපව දැනුවත් කරන ලෙස කාරුණිකව ඉල්ලා සිටිමු.

# 01.අලව්ව ප්‍රාදේශීය සභාවේ  කටයුතු සඳහා කාන්තා නියෝජනය ලබා දීම සඳහා වන ප්‍රතිපත්ති

01.හැඳින්වීම

මීට වසර ගණනාවකට පෙර සමාජය තුළ කාන්තාවකට නිසි තැන ලැබී තිබුණේ නැත. බොහෝ අවස්ථාවලදී කාන්තාව නොසලකා හැරිය තත්ත්වයකට නැතිනම් සමාජයේ දෙවැනි තැන තබා කටයුතු කරන බවත් දක්නට ලැබුණි.එම තත්ත්වය අද වන විට එදා තරම්ම නොවුණත් යම් යම් අවස්ථා අඩු වැඩි වශයෙන් ක්‍රියාත්මක වේ. ඒ අනුව තවමත් සම්පූර්ණයෙන්ම කාන්තාවට සමාජය තුළ ලැබිය යුතු ස්ථානය නිසි ලෙස ලබා දී නොමැත. මෙහි ප්‍රතිඵල ලෙසින් කාන්තා හිංසනය,කාන්තා අයිතිවාසිකම් , ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ අපට කතා කිරීමට සිදුව ඇත. මේ තත්ත්වය සමනය කර ගනිමින් වඩාත් හොඳ ප්‍රවේශයක් ලබා දීමේ අරමුණින් අලව්ව  ප්‍රාදේශීය සභාව අපගේ කටයුතු සඳහා කාන්තා නියෝජනත්වයක් ලබා දීම සම්බන්ධ ප්‍රතිපත්තියක් හැටියට තීරණය කර ඇත. ඒ අනුව පහත ප්‍රතිපත්තීන්හි පිහිටුවා අලව්ව ප්‍රාදේශීය සභාව කටයුතු සිදු කරනවා ඇත

02.නෛතික අධිකාරිය

- අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජනතාවගේ ජන ජීවිතය සුඛිත මුදිත කරලීම සඳහා 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 19 වන වගන්ති ප්‍රකාරව විධි විධාන වලට අනුකූලව හා සම්මත අතුරු ව්‍යවස්ථා වලට අනුව සේවා සැපයීම සඳහා 2023.08.22 වන දින පැවති කළමනාකරණ කමිටුවේ  නිර්දේශ අංක 05 යටතේ නිර්දේශ කර ගත් ප්‍රතිපත්ති පහත සඳහන් පරිදි ප්‍රතිපත්ති සකස් කර ඇත.

03.සීමා සහ කොන්දේසි

- ❖ අදාල වර්ෂයේ අලව්ව ප්‍රාදේශීය සභාව මගින් පත් කර ගන්නා  ස්ථාවර කමිටු
- ❖ උපදේශක කමිටු වල කාන්තා නියෝජනය 25% නියෝජනයක් තිබිම

04.නීතියේ අවශ්‍යතාවය

අදාල කාර්යය සඳහා ප්‍රාදේශිය සභා  පනත , අතුරු ව්‍යවස්ථා මගින් පත්කිරිමට නිතිමය ප්‍රතිපාදනය  හා වැඩසටහන ක්‍රියාත්මක කිරීම නීතියේ අවශ්‍යතාවය වේ.
1.

05.සම්බන්ධ වන පාර්ශවකරුවන්

- අලව්ව ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ කාන්තා නියෝජිත අය

06. ප්‍රතිපත්තිය

- අලව්ව ප්‍රාදේශීය සභාවේ ස්ථාවර කමිටුව සඳහා කාන්තා නියෝජිත අය අදාළ ප්‍රමාණයෙන් පත් කිරිම.
-

06. කාන්තා නියෝජනය පත් කළ යුතු ස්ථාවර කමිටු හා උපදේශන කමිටු තෝරා නියෝජිත

. 1. කාන්තාව සවි බල ගැන්වීම,කාන්තා හිංසනය අවම කිරීම, දරිද්‍රතාවය අවම කිරීම,කාන්තාවට ගෘහස්ථ සමාජය තුළ අනුන්ගේ යැපෙන තත්ත්වයෙන් මුදවාගෙන ස්වයංව නැඟිසිටීමට හැකි තත්ත්වයක් ඇති කිරීම අරමුණු කරගෙන සුදුසු වැඩසටහන් සහ දැනුවත් කිරීමේ වැඩසටහන් වාර්ෂිකව අඛණ්ඩව සැලසුම් කර පවත්වාගෙන යාම.

2. කාන්තාවට සමාජය තුළ ලැබිය යුතු නිසිතැන ලබා දීම සඳහා කාන්තාවට සමාජයෙන් එල්ලවන හිංසනය අවම කරලීම සඳහා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ විශේෂයෙන්ම පුරුෂ පාර්ශවය දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

3. ප්‍රාදේශීය සංවර්ධන ක්‍රියාවලියට කාන්තාව හවුල් කර ගැනීම සඳහා කාන්තා සංවිධානය,කාන්තා නියෝජනත්වයක් ඇති ප්‍රජා සංවර්ධන කොට්ඨාස මට්ටමින් ගොඩනැංවීම හා ඒවා සමග මනා සම්බන්ධිකරණයක් පවත්වා ගෙන යාම.

4. වාර්ෂික අයවැය සකස් කිරිමේ දී හා වාර්ෂික සැලසුම් සැකසීමේ දී කාන්තාවන්ගේ / කාන්තා සංවිධාන වල අදහස් උදහස් යෝජනා ද විමසීම හා ඔවුන්ගේ යෝජනා ඒ තුළ ඉඩක් ලබා දීම.

5. ජාත්‍යාන්තර කාන්තා දිනය,ජාත්‍යාන්තර දියණියන්ගේ දිනය වැනි කාන්තාවන් වෙනුවෙන් වෙන් වූ විශේෂිත දින අලලා ඒ සම්බන්ධව සමාජයට පණිවිඩයක් දිය හැකි ආකාරයේ වැඩසටහන් සභාවේ මැදිහත්වීම මත ක්‍රියාවට නැංවීම.

6. වෙළෙඳපොල අවස්ථා ලබා දීමේ දි කාන්තා ව්‍යාපාරික ප්‍රජාව මූලික කොට සැලකීම.

- ළමා හා කාන්තා අභිවෘද්ධිය
- සාමාජීය සම්බන්ධතා
- අධ්‍යාපනික

07. ස්ථාවර කමිටු හා උපදේශක කමිටු සඳහා තෝරා පත්කරගත් නියෝජිතයින් ප්‍රතිපත්ති තිරණ ගැනිමේදි කටයුතු කිරීම.

ළමා හා කාන්තා අභිවෘද්ධිය ,පවුල් වල ආර්ථික තත්වය ඉහළ නැංවීම සඳහා උපකාර කිරීමේ **අභ්‍යාන්තර ප්‍රතිපත්ති** ඉහත පරිදි ක්‍රියාත්මක විය යුතු බව ලෙස සභාව විසින් පිළිගනී.

.......................

සකස් කළේ

.................. .................... ..................... ........................

ලේකම්

විමර්ශන නිළධාරී
පළාත් පාලන දෙපාර්තමේන්තුව
කුරුණෑගල

මූලස්ථාන ප්‍රජා සං.නි.
පළාත් පාලන දෙපාර්තමේන්තුව
කුරුණෑගල

පළාත් පාලන කොමසාරිස්
පළාත් පාලන දෙපාර්තමේන්තුව
කුරුණෑගල

# 02.අඩු ආදායම්ලාභීන් සඳහා සහනාධාර ලබා දීම වෙනුවෙන් වූ අභ්‍යන්තර ප්‍රතිපත්තිය

## 01. හැදින්වීම

අලව්ව ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ ජනතාවගේ දිළිදුකම පිටු දැකිමට පළාත්පාලන ආයතනයේ අවදානය යොමු කර සහනාධාර සැපයිම කළ යුතුය. දුගී දුපපත්කම සමාජ විරෝධි ක්‍රියා ඇති කිරිමට හේතුවේ. ඒබැවින් පළාත් පාලන ආයතනවලින් ඉටු කරන සමාජ වගකිමක් ලෙස මේ සම්බන්ධව විශේෂ අවධානයක් යොමු කර සපයනු ලබන සුභසාධන සේවාවන් අඩු ආදායම්ලාභීන් අතරට සහන සැලසෙන සහනාධාර වැඩසටහන් ක්‍රියාත්මක කිරිම මුලික අරමුණ වේ.

### 01.නෛතික අධිකාරිය

අලව්ව ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ ජනතාවගේ ජන ජීවිතය සුබිත මුදිත කරලීම සඳහා 1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පණතේ 19 වන වගන්ති ප්‍රකාරව විධි විධාන වලට අනුකූලව හා සම්මත අතුරු ව්‍යවස්ථා වලට අනුව සේවා සැපයිම සඳහා 2023.08.22 වන දින පැවති කළමනාකරණ කමිටුවේ නිර්දේශ අංක 05 යටතේ නිර්දේශ කර ගත් ප්‍රතිපත්ති පහත සඳහන් පරිදි ප්‍රතිපත්ති සකස් කර ඇත.

### 02.සිමා කොන්දේසි

- 2023 අයවැය මගින් වෙන් කර ඇති ප්‍රතිපාදන
- පරිත්‍යාගශිලින්ගේ ආධාර

### 03.නිතියේ අවශ්‍යතාවය

- අදාල කාර්යය සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන නොයික්මවා වැඩසටහන ක්‍රියාත්මක කිරිම නිතියේ අවශ්‍යතාවය වේ.

### 04.සම්බන්ධවන පාර්ෂවකරුවන්

01.අලව්ව ප්‍රාදේශීය සභාවේ සේවය කරනු ලබන සෞඛ්‍ය කම්කරු මහත්ම මහත්මීන්ගේ පාසල් යන වයසේ දරුවන් සඳහා වාර්ෂිකව පාසල් උපකරණ ලබා දීම.

02.පුස්තකාල සාමාජිකත්වය ලබා ගෙන ඇති අඩු ආදායම්ලාභී දරුවන් සඳහා වාර්ෂිකව පාසල් උපකරණ ලබා දීම.

03.බල ප්‍රදේශයේ පදිංචි නිරවුල් ඔප්පු හිමි අඩු ආදායම්ලාභීන් බවට ග්‍රාම නිළධාරී විසින් සහතික කර ඇති අඩක් නිම කළ නිවාසලාභී පාසල් යන වයසේ දරුවන් සිටින පවුල් සඳහා නිවාස ආධාර ලබා දීම ප්‍රමුඛ කොට කටයුතු කිරීම.

04.බල ප්‍රදේශයේ පදිංචි අඩු ආදායම්ලාභී වැසිකිළි නොමැති භාවිතා කිරීමට නොහැකි ලෙස අබලන්ව ඇති වැසිකිළි ඇති නිවෙස් සඳහාවැසිකිළි ආධාර ලබා දීම සිදු කිරීම.

05.විශේෂ අවශ්‍යතා සහිත වූවන් නොමිලේ වැසිකිළි වල කපා දීම සුදුසු බව සභාවේ අභ්‍යන්තර ප්‍රතිපත්තිය වේ.

## 05. ප්‍රතිපත්තිය

01.අලව්ව ප්‍රාදේශිය සභා බලප්‍රදේශයේ පදිංචි සහනාධාරලාභින්ගේ විස්තරය ලබා ගැනිම

- නිවාස ආධාර - අඩු ආදායම්ලාභිබව , කාන්තා ගෘහ මුලික, විශේෂ අවස්තා සහිත පුද්ගලයින්ට ග්‍රාම නිළධාරි වාර්තාව
-
- අධ්‍යාපන ආධාර- විදුහල්පති වාර්තා,ග්‍රාම නිලධාරි වාර්තා ,ක්‍රිඩා සහතික වැනි වාර්තා
- ස්වයං රැකියා- අඩු ආදායම්ලාභිබව , කාන්තා ගෘහ මුලික, විශේෂ අවස්තා සහිත පුද්ගලයින්ට ග්‍රාම නිළධාරි වාර්තාව
- වැසිකිළි අධාර අඩු ආදායම්ලාභිබව , කාන්තා ගෘහ මුලික, විශේෂ අවස්තා සහිත පුද්ගලයින්ට ග්‍රාම නිළධාරි වාර්තාව /මහජන සෞඛ්‍ය පරික්ෂක වාර්තාව
- සභාවේ සෞඛ්‍ය සේවකයින් සම්බන්ධව

02.සහනාධාරලාභින්ගේ උදව් කළයුතු අංශ තෝරා ගැනම

- නිවාස ආධාර වශයෙන්
- ස්වයං රැකියා වශයෙන්
- අධ්‍යාපන ආධාර වශයෙන්
- වෛද්‍ය ආධාර වශයෙන්
- වැසිකිළි ආධාර වශයෙන්

අලව්ව ප්‍රාදේශිය සභා බලප්‍රදේශයේ මහජන ආධාර ලැබිය යුතු පුද්ගලයින් හා පවුල්වලට උපකාර කිරිමේ අභ්‍යන්තර ප්‍රතිපත්තිය ඉහත පරිදි ක්‍රයාත්මක වියයුතු බව සභාව විසින් පිළිගනි.

.......................

සකස් කළේ

| | | | |
|---|---|---|---|
| .................. | .................... | ...................... | ........................ |
| ලේකම් | විමර්ශන නිළධාරී<br>පළාත් පාලන දෙපාර්තමේන්තුව<br>කුරුණෑගල | මූලස්ථාන ප්‍රජා සං.නි.<br>පළාත් පාලන දෙපාර්තමේන්තුව<br>කුරුණෑගල | පළාත් පාලන කොමසාරිස්<br>පළාත් පාලන දෙපාර්තමේන්තුව<br>කුරුණෑගල |

# 03.වරප්‍රසාද නොලත් කණ්ඩායම් සවිබල ගැන්වීම සඳහා වන අභ්‍යන්තර ප්‍රතිපත්ති.

## 01. හැඳින්වීම

වයඹ පළාතේ යටිතල පහසුකම් සංවර්ධන ක්‍රියාවලිය පවත්වාගෙන යාම අපගේ එක් අරමුණක් විය යුතුයි මම සඳහන් කරමි. මෙහිදී මා ඇතුළුව සමස්ථ ගරු සභාවම මෙහි භාරකරුවන් හැටියට බල ප්‍රදේශයේ ජනතාවගේ අයිතීන් සුරක්ෂිත කරලීම උදෙසා ඔවුනගේ අවශ්‍යතා සොයාබලා ඒවාට විසඳුම් ලබාදීමට අවශ්‍ය පියවර ගනිමින් සිටිමු. ඒ සඳහා වන සැලසුම් සැකසීම සහ ඒවා ජනතාවාදී ලෙසින් ක්‍රියාවට නැංවීමද අප විසින් අප විසින් අනිවාර්යයෙන්ම කළ යුතුව ඇත. ඒ අනුව,

## 02. නෛතික අධිකාරිය

අලව්ව ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ ජනතාවගේ ජන ජීවිතය සුඛිත මුදිත කරලීම සඳහා 1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පණතේ 19 වන වගන්ති ප්‍රකාරව විධි විධාන වලට අනුකූලව හා සම්මත අතුරු ව්‍යවස්ථා වලට අනුව සේවා සැපයිම සඳහා 2023.08.22 වන දින පැවති කළමනාකරණ කමිටුවේ නිර්දේශ අංක 05 යටතේ නිර්දේශ කර ගත් ප්‍රතිපත්ති පහත සඳහන් පරිදි ප්‍රතිපත්ති සකස් කර ඇත.

## 03. සීමා කොන්දේසි

- 2023 අයවැය මගින් වෙන් කර ඇති ප්‍රතිපාදන
- පරිත්‍යාගශිලින්ගේ ආධාර

## 04. නීතියේ අවශ්‍යතාවය

- අදාල කාර්ය සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන නොයික්මවා වැඩසටහන ක්‍රියාත්මක කිරීම නීතියේ අවශ්‍යතාවය වේ.

## 05. සම්බන්ධ වන පාර්ශවකරුවන්

- අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජ්‍යෙෂ්ඨ පුරවැසියන්
- අවිධිමත් පදිංචිකරුවන්

## 06. ප්‍රතිපත්තිය

1. විශේෂයෙන්ම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජීවත් වන අපගේ බල ප්‍රදේශය ගොඩ නංවමින් මේ බිම සරුසාර කරන්නට දහඩිය හා කඳුළු හෙලූ වර්තමානයේ තම සැඳෑසමය ගත කරන අපගේ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා සියළු අවස්ථාවලදී ප්‍රමුඛතාවය ලබාදී කටයුතු කිරීමටද,

2. එසේම අප ආයතනය වෙත සේවා පහසුකම් ලබා ගැනිම සඳහා නන් දෙසින් පැමිණෙන ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා ආයතනයේ ගෞරවාදර සහයෝගය ලබාදී කටයුතු කිරීමටද,

3. සභා බල ප්‍රදේශය තුළ තමන්ගේම කියා සුදුසු වාසස්ථාන නොමැතිව ඉතාමත් අඩු පහසුකම් යටතේ ජීවත් වන අවිධිමත් පදිංචිකරුවන් අනෙකුත් රාජ්‍ය ආයතන හා සම්බන්ධ වෙමින් අවශ්‍ය පහසුනට සැලසීමටද,

4. වරප්‍රසාද නොලත් කණ්ඩායම් සඳහා උදව්කල අංශ තෝරා ගැනීම

- ආර්ථික වශයෙන්
- නිවාස සහ සනීපාරක්ෂාව සම්බන්ධව
- අගය කිරීම
- දරුවන්ගේ අධ්‍යාපනය සම්බන්ධව

5.

I. ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා සියළු අවස්ථා වලදී ප්‍රමුඛතාවය ලබා දීමට කටයුතු කිරීම
II. අවිධිමත් පදිංචිකරුවන් සඳහා පහසුකම් සැලසීම
III. වරප්‍රසාද නොලත් කණ්ඩායම් සවිබල ගැන්වීම සඳහා උපකාර කිරීම
IV. වරප්‍රසාද නොලත් පවුල්වල ආබාධ දරුවන් සිටීනම් උපකාර කිරීම
V. වරප්‍රසාද නොලත් පවුල්වල ආර්ථික තත්වය ඉහල නැංවීම සඳහා උපකාර කිරීම

අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සහ අවිධිමත් පදිංචිකරුවන් සහ ඔවුන්ගේ පවුල් වලට උපකාර කිරීමේ අභ්‍යන්තර ප්‍රතිපත්තිය ඉහත පරිදි ක්‍රියාත්මක විය යුතු බව සභාව විසින් පිලිගනී.

......................

සකස් කළේ

.................. .................... .................... ........................

ලේකම්

විමර්ශන නිළධාරී
පළාත් පාලන දෙපාර්තමේන්තුව
කුරුණෑගල

මූලස්ථාන ප්‍රජා සං.නි.
පළාත් පාලන දෙපාර්තමේන්තුව
කුරුණෑගල

පළාත් පාලන කොමසාරිස්
පළාත් පාලන දෙපාර්තමේන්තුව
කුරුණෑගල

# 04.ආබාධිත පුරවැසියන් ආවරණය කිරීම සඳහා වන ප්‍රතිපත්තිය

## 01. හැඳින්වීම

ආබාධිත එසේත් සහෘදයින් නොමැති නම් විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයන් යනු අපගේම කොටසක් සේ සලකා ඔවුන්ටද සමානව ප්‍රතිලාභ බෙදි යාමට හැකිලෙස කටයුතු සැලසුම් කර ක්‍රියාවට නැංවීම ප්‍රතිපත්තියක් ලෙස පිළිගනි.

## 02. නෛතික අධිකාරිය

අලව්ව ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ ජනතාවගේ ජන ජීවිතය සුබිත මුදිත කරලීම සඳහා 1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පණතේ 19 වන වගන්ති ප්‍රකාරව විධි විධාන වලට අනුකූලව හා සම්මත අතුරු ව්‍යවස්ථා වලට අනුව සේවා සැපයිම සඳහා 2023.08.22 වන දින පැවති කළමනාකරණ කමිටුවේ  නිර්දේශ අංක 05 යටතේ නිර්දේශ කර ගත් ප්‍රතිපත්ති පහත සඳහන් පරිදි ප්‍රතිපත්ති සකස් කර ඇත.

## 03. සීමා කොන්දේසි

- 2023 අයවැය මගින් වෙන් කර ඇති ප්‍රතිපාදන
- පරිත්‍යාගශිලින්ගේ ආධාර

## 04. නීතියේ අවශ්‍යතාවය

- අදාල කාර්ය සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන නොයික්මවා වැඩසටහන ක්‍රියාත්මක කිරීම නීතියේ අවශ්‍යතාවය වේ.

## 05. සම්බන්ධ වන පාර්ශවකරුවන්

- විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයන් සහ පවුල් වල අය

## 06. ප්‍රතිපත්තිය

1. ආබාධිත එසේත් සහෘදයින් නොමැති නම් විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයන් යනු අපගේම කොටසක් සේ සලකා ඔවුන්ටද සමානව ප්‍රතිලාභ බෙදි යාමට හැකිලෙස කටයුතු සැලසුම් කර ක්‍රියාවට නැංවීම ප්‍රතිපත්තියක් ලෙස පිළිගනි.

2. සභාව විසින් ක්‍රියාවට නංවන ආධාර වැඩසටහන් සහ සහනාධාර සැපයුම් වැනි වැඩ සටහන් වලදී ප්‍රමුඛතාව මෙම පිරිසට ලබා දිය යුතු බවට පිලිගන්නවා ඇත.

3. සභාව සතු පොදුස්ථානයකටම බාධාවකින් තොරව පිවිසිය හැකි ආකාරයට එනම් රෝද පුටුවක් වැනි උපකරණයක් භාවිතා කර පැමිණීමට හැකි ලෙසට පිවිසුම් මාර්ගයක් සැකසීම හා ඒ ස්ථාන අසල රෝද පුටු තබා තිබීම සුදුසු බවට පිළිගනී.

4. ආදායම් උත්පාදන ස්වයං රැකියා ප්‍රතිලාභින් ක්‍රියාත්මක කිරීමේදී අඩු ආදායම්ලාභීන්ට ප්‍රමුඛතාව ලබා දෙන ආකාරයෙන්ම මෙම පිරිසටද ප්‍රමුඛත්වයක් ලබා දිය යුතු බවට පිළිගනී. උදාහරණ ලෙසට ආබාධිත පුරවැසියන් වෙත ජංගම සංචාරක වෙළඳාම බාධාවකින් තොරව පවත්වාගෙන යාමට හැකි අයුරින් අවශ්‍ය උපකරණ හැකි අයුරින් ලබාදීම සහිතව පිළිගනී.

5. සභාව සතු පෙදු ගොඩනැගිලි වල ආබාධිතයින් සඳහා පහසුකම් සැලසෙන ආකායේ වැසිකිළි පහසුකම් සැකසීම සභාව පිළිගනී.

6. විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් සඳහා උදව් කල යුතු අංශ තෝරා ගැනීම

- විශේෂ අවශ්‍යතා සහිත පවුල්වල ආර්ථික තත්වය , දරුවන්ගේ අධ්‍යාපන තත්වය ඉහල නැංවීමට කටයුතු කිරීම
- නිවාස ඉදිකිරීමට හා සනීපාරක්ෂ පහසුකම් වැඩිදියුණු කිරීම ආධාර උපකාර කිරීම

අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ විශේෂ අවශ්‍යතා ඇති පුරවැසියන් සඳහා ඔවුන්ගේ පවුල් වලට උපකාර කිරීමේ අභ්‍යන්තර ප්‍රතිපත්තිය ඉහත පරිදි ක්‍රියාත්මක විය යුතු බව සභාව විසින් පිලිගනී.

.......................

සකස් කළේ

| ................... | ..................... | ..................... | ......................... |
|---|---|---|---|
| ලේකම් | විමර්ශන නිළධාරී<br>පළාත් පාලන දෙපාර්තමේන්තුව<br>කුරුණෑගල | මූලස්ථාන ප්‍රජා සං.නි.<br>පළාත් පාලන දෙපාර්තමේන්තුව<br>කුරුණෑගල | පළාත් පාලන කොමසාරිස්<br>පළාත් පාලන දෙපාර්තමේන්තුව<br>කුරුණෑගල |

# 05.අවිධිමත් පදිංචිකරුන් සහ අවතැන්වූවන් ආවරණය කිරීමේ ප්‍රතිපත්තිය

## 01. හැඳින්වීම

අලවච් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ආර්ථික අපහසුතා සහිත අවිධිමත් පදිංචිකරුන් සහ අවතැන්වූවන් ආවරණය කිරීමේ ප්‍රතිපත්තිය අවිධිමත් පදිංචිකරුවන් සහ අවතැන් වූවන් යන කාරණා දෙකම එකිනෙකට බැඳී පවත්නා කාරණාවන් වෙති. අවතැන්වූ පුද්ගලයින් කෙසේ හෝ කුමන ස්ථානයක හෝ පදිංචි වීමට උත්සාහ ගනී. ඒ සෑම අවස්ථාවකම ඔවුන්ව නිරායාසයෙන්ම අවිධිමත් පදිංචිකරුවන් බවට පත්වේ. බොහෝ අවස්ථාවල මා ඔය ආශ්‍රිතව පහත් බිම් වල ජල මූලාශ්‍ර ආශ්‍රිතව මේ ආකාර පදිංචිකරුවන් සිටින බව අපි දනිමු. එම තත්ත්වය බරපතළ සමාජීය ගැටළුවකි. එය මඟ හැරීම සඳහා අපද මැදිහත්විය යුතු හෙයින් ඒ සඳහා විය යුතු ප්‍රතිපත්තියක් මෙසේ සකස් කොට ක්‍රියාත්මක කළ යුතු බව පිළිගනී.

මහා මාර්ග දෙපස, රජයට අයත් භූමි භාග වල ජංගම වෙළඳාමේ නියුතු පුද්ගලයින් හඳුනාගෙන ඔවුන්ට එම ව්‍යාපාර කටයුතු බාධාවකින් තොරව පවත්වාගෙන යන ආකාරයට අවශ්‍ය සහය අනෙකුත් රාජ්‍ය ආයතන සමඟ එක්ව ලබාදීම සඳහා මහා මාර්ග දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වැනි රාජ්‍ය ආයතන සමඟ කටයුතු කළ බවට ප්‍රතිපත්තියක් ලෙස පිළිගනී.

බල ප්‍රදේශයේ අවිධිමත් පදිංචිකරුන් සහ අවතැන්වූවන් හඳුනාගෙන නියාමනය කිරීම සඳහා වූ වැඩපිළිවෙළකට අප විසින් යා යුතු බව පිළිගනී.

## 02. නෛතික අධිකාරිය

අලවච් ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජනතාවගේ ජන ජීවිතය සුඛිත මුදිත කරලීම සඳහා 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පණතේ 19 වන වගන්ති ප්‍රකාරව විධි විධාන වලට අනුකූලව හා සම්මත අතුරු ව්‍යවස්ථා වලට අනුව සේවා සැපයීම සඳහා 2023.08.22 වන දින පැවති කළමනාකරණ කමිටුවේ නිර්දේශ අංක 05 යටතේ නිර්දේශ කර ගත් ප්‍රතිපත්ති පහත සඳහන් පරිදි ප්‍රතිපත්ති සකස් කර ඇත.

## 03. සීමා කොන්දේසි

- 2023 අයවැය මගින් වෙන් කර ඇති ප්‍රතිපාදන
- පරිත්‍යාගශීලීන්ගේ ආධාර

## 04. නීතියේ අවශ්‍යතාවය

- අදාල කාර්ය සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන නොයික්මවා වැඩසටහන ක්‍රියාත්මක කිරීම නීතියේ අවශ්‍යතාවය වේ.

## 05. සම්බන්ධ වන පාර්ශවකරුවන්

- අවිධිමත් පදිංචිකරුවන්

## 06. ප්‍රතිපත්තිය

1. බල ප්‍රදේශයේ අවිධිමත් පදිංචිකරුන් සහ අවතැන්වූවන් හඳුනාගෙන නියාමනය කිරීම සඳහා වූ වැඩපිළිවෙළකට අප විසින් යා යුතු බව පිළිගනී.

2. සභා බල ප්‍රදේශය තුළ ගොඩනැගිල්ලක් ඉදි කිරීමේදී ඒ සඳහා අනුමැතියක් සභාව වෙතින් ලබාගත වුවත්, එසේ අනුමැතිය ලබා නොගෙන ඉදි කිරීම තුළින්ද මෙම තත්ත්වය ඇති විය හැකි බවට සභාව හඳුනාගෙන ඇත. උදාහරණ ලෙස වැසිකිළි ඉදි කිරීම, ළිං ඉදි කිරීම, ඉදි කරන ගොඩනැගිල්ලට වාතාශ්‍රය නොලැබීම, අපජලය බැස යාමට ක්‍රමයක් නොමැතිවීම,කසල බැහැර කිරීමට වැඩපිළිවෙලක් නොමැති වීම, ප්‍රමාණවත්

ඉඩකඩක් නොමැති ස්ථාන වල පදිංචි නිවාස ඉදි කිරීම නිසා මෙම ගැටළුව උග්‍ර විය හැකිය. එම තත්ත්වයන් සම්බන්ධව සොයා බැලීමටත්, හඳුනාගත් අයට අවශය මහපෙන්වීම් ලබා දීමටත්, ඉදි කිරීම් සම්බන්ධව නියාමනයක් ඇති කිරීම සුදුසු බවටත් සභාව පිළිගන්නවා ඇත.

3. බල ප්‍රදේශය තුල වෙනත් රාජ්‍ය ආයතන වලට අයත් රක්ෂිත වල පදිංචි වී සිටින දුම්රිය දෙපාර්තමේන්තුවට අයත් රක්ෂිත වල පදිංචිකරුවන්, වෙරළ රක්ෂිත වල පදිංචිකරුවන් සඳහා ඍජු කාලින වැඩපිළිවෙලක් හැටියට නිවාස යෝජනා ක්‍රම ආරම්භ කර ඔවුනට ලබාදී එමඟින් ඔවුන්ගේ නිවාස ගැටළු විසඳීමට මෙන්ම එමඟින් සභාවට ආදායම් උත්පාදන මාර්ගයන් විවර කර ගැනීමට ඇති හැකියාව සම්බන්ධවද මේ සඳහා පෞද්ගලික අංශයේ සහභාගීත්වය ලබා ගැනිමටද ඇති හැකියාව පිළිබඳව සොයා බැලිය යුතු බවට ප්‍රතිපත්තියක් ලෙස මෙම සභාව පිළිගනී.

4. සභාවේ ක්ෂේත්‍ර කාර්යය මණ්ඩලයට අමතරව අනෙකුත් රාජ්‍ය ආයතන වල සහයෝගයද ලබා ගනිමින් අවිධිමත් පදිංචිකරුවන් හඳුනා ගැනීම හා ඉදිරියේදී එවැනි අවස්ථාවන් ඇතිවීම වළක්වා ගැනීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කළ යුත් බවමටද පිළිගනී.

අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අවිධිමත් පදිංචිකරුවන් සඳහා ඔවුන්ගේ පවුල් වලට උපකාර කිරීමේ අභ්‍යාන්තර ප්‍රතිපත්තිය ඉහත පරිදි ක්‍රියාත්මක විය යුතු බව සභාව විසින් පිළිගනී.

........................

සකස් කළේ

| | | | |
|---|---|---|---|
| .................. | .................... | ..................... | ........................ |
| ලේකම් | විමර්ශන නිළධාරි<br>පළාත් පාලන දෙපාර්තමේන්තුව<br>කුරුණෑගල | මූලස්ථාන ප්‍රජා සං.නි.<br>පළාත් පාලන දෙපාර්තමේන්තුව<br>කුරුණෑගල | පළාත් පාලන කොමසාරිස්<br>පළාත් පාලන දෙපාර්තමේන්තුව<br>කුරුණෑගල |

# 06.ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට වයපීරේබ විධි විධාන පිරිනැමීම සඳහා වන ප්‍රතිපත්ති.

## 01. හැඳින්වීම

ජ්‍යෙෂ්ඨ පුරවැසියන් යනු වර්තමානයේ අප භුක්ති විඳින වරප්‍රසාද හා ප්‍රතිලාභ අප වෙනුවෙන් ඉතිරි කරන්නට අතීතයේ කැපවීම් සිදුකළ අපගේ වටිනා මානව සම්පත බවට මෙම සභාව පිළිගන්නවා ඇත.

## 02. නෛතික අධිකාරිය

අලව්ව ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ ජනතාවගේ ජන ජීවිතය සුඛිත මුදිත කරලීම සඳහා 1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පණතේ 19 වන වගන්ති ප්‍රකාරව විධි විධාන වලට අනුකූලව හා සම්මත අතුරු ව්‍යවස්ථා වලට අනුව සේවා සැපයිම සඳහා 2023.08.22 වන දින පැවති කළමනාකරණ කමිටුවේ නිර්දේශ අංක 05 යටතේ නිර්දේශ කර ගත් ප්‍රතිපත්ති පහත සදහන් පරිදි ප්‍රතිපත්ති සකස් කර ඇත.

## 03. සීමා කොන්දේසි

- 2023 අයවැය මගින් වෙන් කර ඇති ප්‍රතිපාදන
- පරිත්‍යාගශිලින්ගේ ආධාර

## 04. නීතියේ අවශ්‍යතාවය

- අදාල කාර්ය සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන නොයික්මවා වැඩසටහන ක්‍රියාත්මක කිරීම නීතියේ අවශ්‍යතාවය වේ.

## 05. සම්බන්ධ වන පාර්ශවකරුවන්

- ජ්‍යෙෂ්ඨ පුරවැසියන්

## 06. ප්‍රතිපත්තිය

1. ඒ අනුව අපි අපගේ පාලන ක්‍රියාවලිය හා මෙහෙවුම් ක්‍රියාවලිය සඳහා සැමවිටම ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ උපදෙස් හා මඟපෙන්වීම්ද වටිනා අදහස් හා යෝජනාද ලබා ගත යුතු බවටත්, ඊට ඉඩකඩ සැලසීම වස් සභාවේ උපදේශක කමිටු වලට ඔවුනගේ නියෝජනත්වයක් ලබා දීම සුදුසු බවට පිළිගනි.

2. සේවාලාභියෙකු හැටියට අප වෙත පැමිණෙන ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ අවශ්‍යතා කඩිනමින් විමසා බලා ඒ සඳහා අවශ්‍ය පිළියම් යෙදීම සඳහා සුදුසු යාන්ත්‍රණයක් සකසනවා ඇත. මෙහිදී විශේෂයෙන්ම කාර්යාලයට පැමිණෙන ජ්‍යෙෂ්ඨ පුරවැසියන් කඩිනමින් අදාළ නිළධාරීන් හමුවට යොමු කිරීමට හෝ අවස්ථාවෝචිත පරිදි අදාළ නිළධාරියා ඔවුන් හමුවය යොමු කරවීම සඳහා කාර්යාල සහයක වරයෙකු වෙන් කර තැබීමට කටයුතු කළ යුතු බවට පිළිගනී.

3. ජ්‍යෙෂ්ඨ පුරවැසියන් පැමිණි විට ඔවුන්ට කිසියම් ලිපි කටයුත්තක් වැන් කාරණාවක් සිදු කර ගැනීමට අවශ්‍ය වූ විට ඔවුන් වෙනුවෙන් පනවා ඇති ආසන වල ඔවුන්ට වාඩි වීමට ඉඩ හැර අවශ්‍යතාවය විමසා බලා කඩිනමින් කටයුතු කිරීමේ වගකිම ඒ ඒ අංශ වල අංශ ප්‍රධානීන්ට පැවරීම කළ යුතු බවට පිළිගනී.

4. පවතින නෛතික රාමුව තුළ රැඳී සිටිමින් හැකි සෑම අවස්ථාවකම ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ අවශ්‍යතා මිලක් අය නොකර ඉටු කර දීම සුදුසු බවට පිළින්නවා ඇත.

උදාහරණ - ලිපියක පිටපතක් ලබාදීම , අවශ්‍යතා සඳහා දුරකථන ඇමතුමක් ලබාදීම, නොමිලේ ඉටුකර දීම දැක්විය හැකිය.

5. සභාවේ අයවැය සම්පාදනය සැලසුම් සම්පාදනය ප්‍රතිපත්ති සම්පාදනය, වැනි ක්‍රියාවලදී අනිවාර්යයෙන්ම ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ සම්බන්ධතාවය ලබා ගැනිමට හැකි සෑම විටකම පියවර ගත යුතු බවට ප්‍රතිපත්තියක් ලෙස පිළිගන්නවා ඇත.

6. ජ්‍යෙෂ්ඨ පුරවැසියන් යනු මෙම සමාජ පරිසරය තුළ අප විසින් හැකිතාක් දුරට ඉහළට ඔසවා තැබිය යුතු පිරිසක් බව අප පොදුවේ පිළිගන්නවා ඇත.

7. රාජ්‍ය ආයතන වල සහයෝගයද ලබා ගනිමින් ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා පිලිගත් වැඩසටහනක් තුලින් ඉදිරියේදී ක්‍රියාත්මක කිරීම කළ යුතු බව පිළිගනී.

අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා ඔවුන්ගේ පවුල් වලට උපකාර කිරීමේ අභ්‍යන්තර ප්‍රතිපත්තිය ඉහත පරිදි ක්‍රියාත්මක විය යුතු බව සභාව විසින් පිලිගනී.

.......................

සකස් කළේ

| | | | |
|---|---|---|---|
| ................... | .................... | ..................... | ........................ |
| ලේකම් | විමර්ශන නිළධාරී<br>පළාත් පාලන දෙපාර්තමේන්තුව<br>කුරුණෑගල | මූලස්ථාන ප්‍රජා සං.නි.<br>පළාත් පාලන දෙපාර්තමේන්තුව<br>කුරුණෑගල | පළාත් පාලන කොමසාරිස්<br>පළාත් පාලන දෙපාර්තමේන්තුව<br>කුරුණෑගල |

## 07.අලව්ව ප්‍රාදේශීය සභාවේ පරිසර ප්‍රතිපත්ති

01.හැඳින්වීම

නිකසල පරිසරයක් තුළ ජනිත වන්නා වූ වටපිටාවක ගහට කොළට, සතා සිවුපාවාට ඇලට - දොළට ආදරය කරන සමාජයක් ගොඩනංවමින් ඒ තුළින් නිරෝගීමත් පිරිසකට පහස දෙන හෙට උපදින මතුපරපුරට හරිත පරිසරයක උරුමය ලබා දෙන්නට හැකි සැලසුම් සහගත ප්‍රවේශයකට සැමවිටම අනුගත කටයුතු කරන අලව්ව ප්‍රාදේශිය සභාවේ සභා බල ප්‍රදේශය තුළ පහත කරුණු ඉටුවිය යුතු බවට ප්‍රතිපත්තියක් ලෙස පිළිගන්නවා ඇත.

02.නෛතික අධිකාරිය

- අලව්ව ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ ජනතාවගේ ජන ජීවිතය සුඛිත මුදිත කරලීම සඳහා 1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පණතේ 149 වන වගන්ති
- 1990 අංක 12 දරණ පළාත් පරිසර ප්‍රඥප්තිය
- අංක1685/11_2010-12-21 දිනැති අති විශේෂ ගැසට් පත්‍රය
- වයඹ පළාත් ප්‍රධාන අමාත්‍යවරයාගේ නියෝග

ප්‍රකාරව විධි විධාන වලට අනුකූලව හා සම්මත අතුරු ව්‍යවස්ථා වලට අනුව සේවා සැපයිම සඳහා 2023.08.22 වන දින පැවති කළමනාකරණ කමිටුවේ නිර්දේශ අංක 05 යටතේ නිර්දේශ කර ගත් ප්‍රතිපත්ති පහත සදහන් පරිදි ප්‍රතිපත්ති සකස් කර ඇත.

03.සීමා සහ කොන්දේසි

- ව්‍යාපාරය පවත්වාගෙන යාමේදී පරිසර හානිය අවම තත්වයෙන් පවතින බවත්
- වාර්ෂිකව **බලපත්‍ර ලබා ගැනීම.**
- පළාත් පරිසර අධිකාරියේ නීති රීති වලට යටත්ව කටයුතු කිරීම.

**04.නීතියේ අවශ්‍යතාවය**

අදාල කාර්යය සදහා පළාත් පරිසර අධිකාරියේ නීති රීති වලට යටත්ව කටයුතු කිරීම නීතියේ අවශ්‍යතාවය වේ.

**05.සම්බන්ධ වන පාර්ශවකරුවන්**

- **ලේකම්**
- **ප්‍රජා සංවර්ධන නිළධාරී**
- **පරිසර නිළධාරී**

- ආදායම් පරීක්ෂක සහ කාර්මික නිළධාරී
- මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්
- බල ප්‍රදේශයේ ව්‍යාපාරික ප්‍රජාව

**06. ප්‍රතිපත්තිය**

**01.01 සුදුසුකම්**

**ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත කර්මාන්තයක් ආරම්භ කිරීමට අදහස් කරනු ලබන නැතහොත් එවැනි කර්මාන්තයක් කරගෙන යනු ලබන තැනැත්තන්**

**05.02. ගාස්තුව**

**(අ). ඉල්ලුම් පත්‍ර ගාස්තුව - රු.100.00**

**(ආ) බලපත්‍ර අලුත් කිරීමේ ගාස්තුව- රු. 50.00**

**(ඇ.)ක්‍රියාවලිය** සඳහා අය කරනු ලබන පරීක්ෂණ ගාස්තුව ව්‍යාපාරයේ ප්‍රාග්ධනය අනුව පහත පරිදි වේ.

| අ.අ | ආයෝජනය (රු.) | පරීක්ෂණ ගාස්තුව (රු.) |
|---|---|---|
| 01 | රු.100000 දක්වා | රු. 1000.00 |
| 02 | රු. 2500.00 | රු. 1500.00 |
| 03 | රු.200001 ට වැඩි එහෙත් 500000 දක්වා | රු. 2500.00 |
| 04 | රු.500000 සිට 100000 දක්වා | රු. 5000.00 |
| 05 | රු. 1000000 ට සිට 1500 000 දක්වා | රු. 7500.00 |
| | රු.1500000 වඩා වැඩි | රු.10000.00 |

**(ඈ) බලපත්‍ර ගාස්තුව - රු.1250.00**

**06. ප්‍රතිපත්තිය**

**.......................**

සකස් කළේ

| | | | |
|---|---|---|---|
| ................... | .................... | ..................... | ........................ |
| ලේකම් | විමර්ශන නිළධාරී<br>පළාත් පාලන දෙපාර්තමේන්තුව<br>කුරුණෑගල | මූලස්ථාන ප්‍රජා සං.නි.<br>පළාත් පාලන දෙපාර්තමේන්තුව<br>කුරුණෑගල | පළාත් පාලන කොමසාරිස්<br>පළාත් පාලන දෙපාර්තමේන්තුව<br>කුරුණෑගල |

## 08. අලව්ව ප්‍රාදේශීය සභාවේ ජල හා සනීපාරක්ෂක ප්‍රතිපත්තිය

### 01.හැඳින්වීම

බල ප්‍රදේශයේ ජනතාවගේ කායික, මානසික, සමාජීයීය වශයෙන් යහපපැවැත්ම ආරක්ෂා කිරීම වැඩි දියුණු කිරීම, සඳහා බල ප්‍රදේශය තුල පවතින පොදු අධිකාරිය පළාත් පාලන ආයතනය නිසා වන බැවින්, බල ප්‍රදේශයේ ජනතාවගේ පානීය ජල අවශ්‍යතාව සපුරාලීම සඳහා අවශ්‍ය පියවර ගැනීම . ප්‍රජා මූළ සංවිධාන පිහිටුවීමටත් අවශ්‍ය පහසුකම් සපයමින් සහ පවතින ප්‍රජා මූල සංවිධාන දිරිමත් කිරීමත්, නළ ළිං පොදු ළිං, නාන ළිං සහ අනකුත් ජල මූලාශ්‍ර සුරක්ෂිත කිරීමත්, ජල සාම්පල් පරීක්ෂාව මගින් ජලයෙහි යෝග්‍යතාව පිළිබඳ වාර්තා ලබා ගැනීමත්,ජලය නොමැති ජනතාවට පානීය ජලය බවුසර් මගින් බෙදා දීම සඳහාත් අවශ්‍ය විට මුල්‍ය ප්‍රතිපාදන ලබා දීම සඳහා අයවැය මගින් මුදල් වෙන් කිරීම.

### 02.නෛතික අධිකාරිය

අලව්ව ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ ජනතාවගේ ජන ජීවිතය සුඛිත මුදිත කරලීම සඳහා 1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පණතේ 19 වන වගන්ති ප්‍රකාරව විධි විධාන වලට අනුකූලව හා සම්මත අතුරු ව්‍යවස්ථා වලට අනුව සේවා සැපයිම සඳහා 2023.08.22 වන දින පැවති කළමනාකරණ කමිටුවේ නිර්දේශ අංක 05 යටතේ නිර්දේශ කර ගත් ප්‍රතිපත්ති පහත සඳහන් පරිදි ප්‍රතිපත්ති සකස් කර ඇත.

### 03.සීමා සහ කොන්දේසි

- 2023 වර්ෂයේ අයවැය මගින් වෙන් කර ඇති ප්‍රතිපාදන
- රාජ්‍ය මූල ප්‍රභවයන්

### 04.නීතියේ අවශ්‍යතාවය

1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පණතේ 19 වන වගන්ති ප්‍රකාරව අදාල කාර්යය සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන නොඉක්මවා වැඩසටහන ක්‍රියාත්මක කිරීම නීතියේ අවශ්‍යතාවය වේ.

### 05.සම්බන්ධ වන පාර්ශවකරුවන්

- **ලේකම්**
- **ප්‍රජා සංවර්ධන නිළධාරී**
- **පරිසර නිළධාරී**
- **ආදායම් පරීක්ෂක සහ කාර්මික නිළධාරී**
- **මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්**
- **බල ප්‍රදේශයේ ව්‍යාපාරික ප්‍රජාව**

**06. ප්‍රතිපත්තිය**

01.රෝග නිවාරණය සහ රෝග ව්‍යාප්තිය පාලනය කිරීමට මැසි මදුරු උවදුරු,ජල භීතිකා සහ වෙනත් බෝ වන රෝග වැලැක්වීම සඳහා සෞඛ්‍ය වෛද්‍ය නිළධාරී කාර්යාල සමග ඒකාබද්ධව වැඩ සටහන් සිදු කිරීම ත්, ඒ සඳහා අය වැය මගින් ප්‍රතිපාදන සැපයීමත්,

02. ආහාර හැසිරවීමේ ආයතන නියාමනය කිරීම සඳහා ආහාර හැසිරවීමේ ආයතන ශ්‍රේණි ගත කිරීම සහ ආහාර සාම්පල් පරීක්ෂාව වෙනුවෙන් වැඩසටහන් සැකසීම ,ක්‍රියාත්මක කිරීම සහ ඒ සඳහා ප්‍රතිපාදන සැපයීමත්,

4. මාතෘ සහ ළමා පෝෂණය නැංවීම, සහ දරිද්‍රතාව තුරන් කිරීම සඳහා ආධාර සහ අනුබල ලබා දීමේ වැඩ සටහන් සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමත්, ළමා හා මාතෘ සායන පහසුකම් වැඩි දියුණු කිරීමට ප්‍රතිපාදන සැපයීමත්,

6. ජලාපවහනය, මලාපවහනය සම්බන්ධයෙන් වැඩ පිළිවෙලවල් සැකසීම සහ ක්‍රියාත්මක කිරීම. විධිමත් කාණු පද්ධතියක් නඩත්තු කිරීම සහ ගලි රථ සේවාවන් පවත්වා ගැනීමත්, වැසිකිළි තනා ගැනීම සඳහා උපදෙස් සහ ආධාර ලබා දීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන්කිරීමත්,

අලව්ව ප්‍රාදේශීය සභාවේ ජල හා සනීපාරක්ෂක ප්‍රතිපත්තිය ලෙස සභාව විසින් පිළිගනී .

.......................

සකස් කළේ

| ................... | .................... | ..................... | ........................ |
|---|---|---|---|
| ලේකම් | විමර්ශන නිළධාරී<br>පළාත් පාලන දෙපාර්තමේන්තුව<br>කුරුණෑගල | මූලස්ථාන ප්‍රජා සං.නි.<br>පළාත් පාලන දෙපාර්තමේන්තුව<br>කුරුණෑගල | පළාත් පාලන කොමසාරිස්<br>පළාත් පාලන දෙපාර්තමේන්තුව<br>කුරුණෑගල |

## 09.සනීපාරක්ෂක සේවකයින්ට සහ ඔවුන්ගේ පවුල් වලට උපකාර කිරීමේ අභ්‍යන්තර ප්‍රතිපත්ති

### 01.හැඳින්වීම

අලව්ව ප්‍රාදේශීය සභාවේ සෞඛ්‍ය සේවකයින් නගර පවිත්‍රතාව ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් කටයුතු සිදු කරන අතර සිදු කළ සේවාව අගය කිරීම මෙහිදී සිදු වේ.මෙහිදී සෞඛ්‍ය සේවකයින් වර්ෂය පුරා නාගරික අපද්‍රව්‍ය සමග සිදු කළ සේවය හා ඔවුන්ගේ මානසික නිදහස හා සතුට වෙනුවෙන් මෙන්ම ඉදිරි වර්ෂයේ වැඩ කටයුතු සඳහා අභිප්‍රේරණයක් ලෙස මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම මූලික අරමුණ වේ.

### 02.නෛතික අධිකාරිය

- අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජනතාවගේ ජන ජීවිතය සුඛිත මුදිත කරලීම සඳහා 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 19 වන වගන්ති ප්‍රකාරව විධි විධාන වලට අනුකූලව හා සම්මත අතුරු ව්‍යවස්ථා වලට අනුව සේවා සැපයීම සඳහා 2023.08.22 වන දින පැවති කළමනාකරණ කමිටුවේ නිර්දේශ අංක 05 යටතේ නිර්දේශ කර ගත් ප්‍රතිපත්ති පහත සඳහන් පරිදි ප්‍රතිපත්ති සකස් කර ඇත.

### 03.සීමා සහ කොන්දේසි

- ❖ 2023 වර්ෂයේ අයවැය මගින් වෙන් කර ඇති ප්‍රතිපාදන
- ❖ පරිත්‍යාගශීලීන්ගේ ආධාර

### 04.නීතියේ අවශ්‍යතාවය

අදාල කාර්යය සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන නොඉක්මවා වැඩසටහන ක්‍රියාත්මක කිරීම නීතියේ අවශ්‍යතාවය වේ.

### 05.සම්බන්ධ වන පාර්ශවකරුවන්

- අලව්ව ප්‍රාදේශීය සභාවේ සනීපාරක්ෂක සේවකයින්
- අලව්ව ප්‍රාදේශීය සභාවේ සනීපාරක්ෂක සේවකයින්ගේ පවුල් වල අය

### 06. ප්‍රතිපත්තිය

1. අලව්ව ප්‍රාදේශීය සභාවේ සනීපාරක්ෂක සේවකයින්ගේ පවුල් වල විස්තර ලබා ගැනීම.

- කලත්‍රයා සම්බන්ධ විස්තර
- පවුලේ සාමාජික සංඛ්‍යාව
- ඔවුන්ගේ ආදායම් මට්ටම
- නිවාස වල තත්වය

2. සනීපාරක්ෂක සේවතයින් සඳහා උදව් කළ යුතු අංශ තෝරා ගැනීම.

- ආර්ථික වශයෙන්
- දරුවන්ගේ අධ්‍යාපනය සම්බන්ධව
- නිවාස සහ සනීපාරක්ෂාව සම්බන්ධව

3.සනීපාරක්ෂක සේවකයින්ගේ සෞඛ්‍ය හා සනීපාරක්ෂාව සඳහා උපකාර කිරීම.

4.දරුවන්ගේ අධ්‍යාපනය සඳහා උපකාර කිරීම.

5..සනීපාරක්ෂක සේවකයින්ගේ පවුල් වල විශේෂ දක්ෂතා ඇති දරුවන් සිටී නම් ඔවුන්ට උපකාර කිරීම.

6.සනීපාරක්ෂක සේවකයින්ගේ පවුල් වල ආබාධිත දරුවන් සිටී නම් ඔවුන්ට උපකාර කිරීම.

7.සනීපාරක්ෂක සේවකයින්ගේ පවුල් වල ආර්ථික තත්වය ඉහළ නැංවීම සඳහා උපකාර කිරීම.

අලව්ව ප්‍රාදේශීය සභාවේ **සනීපාරක්ෂක සේවතයින්ට සහ ඔවුන්ගේ පවුල් වලට උපකාර කිරීමේ අභ්‍යන්තර ප්‍රතිපත්ති** ඉහත පරිදි ක්‍රියාත්මක විය යුතු බව ලෙස සභාව විසින් පිළිගනී.

.......................

සකස් කළේ

| .................. | .................... | ..................... | ........................ |
|---|---|---|---|
| ලේකම් | විමර්ශන නිළධාරී<br>පළාත් පාලන දෙපාර්තමේන්තුව<br>කුරුණෑගල | මූලස්ථාන ප්‍රජා සං.නි.<br>පළාත් පාලන දෙපාර්තමේන්තුව<br>කුරුණෑගල | පළාත් පාලන කොමසාරිස්<br>පළාත් පාලන දෙපාර්තමේන්තුව<br>කුරුණෑගල |

## 10. ප්‍රසම්පාදනයට අදාල අභ්‍යන්තර ප්‍රතිපත්තීන්

1. දේශීය හා ප්‍රාදේශීය ව්‍යයසායකයින් හට ප්‍රමුඛස්ථානය ලබාදේම.
2. කාන්තා ව්‍යවසායකයින් හට ප්‍රමුඛස්ථානය ලබ දීම.
3. ආභාධිත ව්‍යයසායකයින් හට ප්‍රමුඛස්ථානය ලබා දීම.

මේ තුළින් ප්‍රාදේශීය වශයෙන් සුළු ව්‍යවසායකයින් මඟින් නිෂ්පාදන මිලට ගෙන ව්‍යවසායකයින් නඟා සිටුවීම

| | | |
|---|---|---|
| ....................... | ....................... | ....................... |
| සකස් කළේ | නිර්දේශ කරමි | අනුමත කරමි. |
| කේ.ඒ.අයි.එස් කළුආරච්චි, | එම්.පී.සී.රේණුකා, | පළාත් පාලන කොමසාරිස්, |
| ප්‍රජා සංවර්ධන නිළධාරි, | ලේකම්, | පළාත් පාලන දෙපාර්තමේන්තුව |
| ප්‍රාදේශිය සභාව, | ප්‍රාදේශිය සභාව, | කුරුණෑගල |
| අලව්ව | අලව්ව. | |